**ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය - 2020**

---

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2019 මැයි 14 දින එළඹි අංක 6371 - එල්කේ දරන ණය ගිවිසුමේ උපලේඛන 01 හි 4.2 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රජාවන්ට ප්‍රතිචාරාත්මකව හා වගවීමකින් යුතුව සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහභාගී වන පළාත්වලට සහාය වීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 17,665.63කට සමාන එජඩො මිලියන 100.65ක් වන අතර ඉන් රු.මිලියන 12,222.41කට සමාන එජඩො මිලියන 70ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 4,220.98කට සමාන එජඩො මිලියන 23.65ක් මූල්‍යයනය කිරීම යුරෝපා සංගමය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 30 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

**1.3 මතය**

---

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 නොසැසඳුණු ශේෂ

| ලෙජර් ගිණුම | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. මිලියන | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. මිලියන | අනුරූපී වාර්තා පිළිබඳ විස්තරය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| බැංකුවේ ඇති මුදල් (අංක 134 පළාත් පාලන ආයතනය) | 47.62 | නැත | බැංකු සනාථන ලිපි | අදහස් දක්වා නොමැත | බැංකු සනාථන සමග අනුකූලවීමට අවශ්‍ය වේ. |

## 2.2 නීති, රීති රෙගුලාසි සමග අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2109 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.3 (ඇ) වගන්තිය | චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව, උතුරු මැද සහ ඌව පළාත් පාලන ආයතනවල කොමසාරිස් නියෝජ්‍ය අධ්‍යක්ෂක ලෙස පත්කර තිබුණු අතර එකතුව රු.963,700ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව ප්‍රධාන ලේකම් කටයුතු කර ඇත්ද යන්න සොයා බැලීමට ව්‍යාපෘති අධ්‍යක්ෂක උපදෙස් ලබා දී ඇත. | නීති සහ රෙගුලාසිවලට පටහැනිව ගෙවන ලද වැටුප් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2109 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 02ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට අවශ්‍ය වේ. |
| (ඇ) | 2019 ජනවාරි 12 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | වර්ෂයක් තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රැස්වීම් නොපැවැත්වුණි. | විගණන හා කළමනාකරණ රැස්වීම් නියමිත පරිදි පැවැත්වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 626 | වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේ පහසුව සඳහා ද්විත්ව සටහන් ක්‍රමය මත පොත්පත් සහ වාර්තා පවත්වා ගත යුතුය. කෙසේවෙතත්, පළාත් ආයතන විසින් එම අවශ්‍යතා අනුගමනය කර නොතිබුණි. | එය නිවැරදි කිරීමට පළාතේ ක්‍රියාත්මක කිරීමේ ඒකක වෙත උපදෙස් ලබාදී තිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් අවශ්‍යතා සමග එකඟවීම අවශ්‍ය වේ. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.9.2 වගන්තිය | නිසි පැමිණීමේ සහතික ලබා ගැනීමෙන් තොරව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙත එකතුව රු.117,000ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි සඳහන් අවශ්‍යතා සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ව්‍යාපෘතිය පළාත් සේවා සැපයීමට සහ ආර්ථික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට පළාත් 04ක පළාත් පාලන ආයතනවල සහය දැක්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, උප ව්‍යාපෘති සඳහා නිසි අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු. මිලියන 283.82ක මුදලක් පළාත් සභා 04 කට ගෙවා තිබුණි. | පූර්ණ අනුමැතිය මත උප අග්‍රිම නිදහස් කර ඇත. | ව්‍යාපෘතිය, උප ව්‍යාපෘති අනුමත කර ගැනීමට සහ උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතන පෙළඹවීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති මූල්‍ය ගිවිසුම අනුව, උප ව්‍යාපෘති පළාත් පාලන සහභාගිත්ව සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතා අනුව තෝරා ගත යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘති කළමනාරකරණ ඒකකය පළාත් ක්‍රියාත්මක කිරීමේ ඒකක වෙත ඉහත ප්‍රමුඛතා ලැයිස්තුව අනුව තෝරා නොගැනීමට උපදෙස් ලබාදී ඇත. | අදහස් දක්වා නොමැත. | ණය ගිවිසුමේ දැක්වෙන මාර්ගෝපදේශ අනුව උප ව්‍යාපෘති තෝරා ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, කාර්යසාධන මත ප්‍රදාන ගෙවීම් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කළ යුතුය. කෙසේවෙතත්, කිසිදු නිර්ණායකයක් හඳුන්වා නොදීම | අදහස් දක්වා නොතිබුණි. | කාර්යසාධන ප්‍රදාන සඳහා නිර්ණායක හඳුන්වාදීමට පියවර ගත යුතුය. |

හේතුවෙන් පළාත් පාලන ආයතනවලට කාර්යසාධනය මත ප්‍රදාන ගෙවීම් ආරම්භ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 70ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

**3.2 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන්**

---------------------------------------------------

ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ 2.12 වගන්තිය අනුව, 2021 ජුනි 30 දිනට ව්‍යාපෘතියේ ප්‍රධාන කටයුතු ආරම්භ කර නොතිබුණි.

| | ක්‍රියාකාරකම | ආරම්භ කිරීමට සැලැසුම් කළ දිනය | ප්‍රමාදය (මාස) | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|
| (i) | පළාත් පාලන ආයතනවල ප්‍රසම්පාදන අත්පොත වැඩිදියුණු කිරීම පළාත් පාලන ආයතනවලට එය බෙදාහැරීම | 2019 අප්‍රේල් 30 වන විට | 20 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ දුර්වලතා |
| (ii) | කළමනාකරණ තොරතුරු පද්ධති උපදේශකවරු බඳවා ගැනීම | 2019 අගෝස්තු 31 වන විට | 16 | |
| (iii) | පළාත් පාලන ප්‍රදේශය තුළ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය පිළිබඳ තොරතුරු පද්ධතියක් ස්ථාපනය හා බෙදාහැරීම | 2019 අගෝස්තු 31 වන විට | 16 | |
| (iv) | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සඳහා සැලසුම්කරණ උපදේශකවරු බඳවා ගැනීම | 2019 අගෝස්තු 31 වන විට | 16 | |
| (v) | වාර්ෂික කාර්යසාධන ඇගයීම් සඳහා උපදේශකවරු බඳවා ගැනීම | 2019 අගෝස්තු 31 වන විට | 16 | |
| (vi) | ආර්ථික යටිතල පහසුකම් යටතේ ආයෝජන සඳහා විස්තරාත්මක සැලසුම් පිළියෙල කිරීම සහ අනුමත කිරීම (සියලුම පළාත්වල සංකල්පීය සහ විස්තරාත්මක සැලැස්ම) | 2019 දෙසැම්බර් 31 වන විට | 12 | |
| (vii) | ආර්ථික යටිතල පහසුකම් ආයෝජන සඳහා ලංසු කැඳවීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය | 2020 මාර්තු 31 වන විට | 21 | |
| (viii) | කළමනාකරණ තොරතුරු පද්ධති පදනම් කර ගත් ගිණුම්කරණය, වත්කම් තොග කළමනාකරණය පුරවැසියන්ගේ ප්‍රතිචාරය සහ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් ආරම්භ කිරීම | 2020 ජුනි 30 වන විට | 18 | |

**කළමනාකරණයේ ප්‍රතිචාර** — අදහස් දක්වා නොතිබුණි.

**විගණකගේ නිර්දේශ** — කටයුතු හැකි විගස ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් සැලැස්ම සංශෝධනය කළ යුතුය.

**3.3 අසම්පූර්ණ උපදේශක කටයුතු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|
| උතුරු සහ නැගෙනහිර පළාත්වල ධාරිතා වර්ධනය, අධීක්ෂණය හා ඇගයීම, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සහ ඌව සහ උතුරු මැද පළාත්වල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 2020 ජනවාරි 10 දින හෝ ඊට පෙර නිම කිරීමට උපදේශකවරු 04 දෙනෙකු පත්කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 3.69ක කොටස් ගෙවීමක් සිදුකර තිබුණද, ව්‍යාපෘති අධ්‍යක්ෂක ඉහත සඳහන් උපදේශක කටයුතු නිසි පරිදි නිම කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අසම්පූර්ණ වැඩ නිම කරනු ලැබේ. | ගෙවීම් නැවත අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින දක්වා උතුරු මැද පළාත, උතුරු පළාත සහ අදාළ පළාත් පාලන ආයතනයන් විසින් පළාත් පාලන ආයතන සහභාගිත්ව සංවර්ධන සැලසුම පිළියෙල කිරීම සඳහා එකතුව රු.4.93ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, අදාළ පළාත් පාලන ආයතනයන් විසින් පාලන ආයතන සහභාගිත්ව සංවර්ධන සැලසුම පිළියෙල කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් සහිත උප ව්‍යාපෘති තෝරා ගැනීමට අසමත්වීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදම් බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ණය ගිවිසුමේ මාර්ගෝපදේශ අනුව උප ව්‍යාපෘති තෝරා ගත යුතුය. |
| (ආ) | තාක්ෂණික ප්‍රසම්පාදන, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පළාත් පාලන සහභාගිත්ව සංවර්ධන සැලැස්ම සඳහා පහසුකම් සපයන්නා සහ පාරිසරික සහ සමාජ ආරක්ෂණ සඳහා පත් කරන ලද උපදේශකවරු හතර දෙනා සඳහා රු.මිලියන 6.47ක් ගෙවා තිබුණ ද, නියමිත කාලය තුළදී අදාළ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම වියදම නිශ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. | අසම්පූර්ණ වැඩ නිම කරනු ලැබේ. | ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණන නිරීක්ෂණ |
| --- | --- | --- |
| සම්පූර්ණ කාලයේ නියුතු ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයකු සහිත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවා නොතිබුණු අතර කාර්යමණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීමට අසමත්වී තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති ආරම්භ කිරීමේ කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණු කාර්ය මණ්ඩලය අර්ධකාලීනව පත්කර තිබුණි. | ජනාධිපතිවරණය සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හේතුවෙන් පත්කිරීම් සිදු කිරීමට නොහැකි විය. | ඒ සඳහා වෙන් වූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවිය යුතු අතර හැකි විගස පූර්ණකාලීන ව්‍යාපෘති කාර්යමණ්ඩලයක් පත් කළ යුතුය. |

## 3.6 පද්ධති හා පාලනයන්

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| (අ) | ණය ගිවිසුම අනුව, පළාත් සභා 04 සමග ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගෙන තිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමෙන් පසුව පළාත් සභා සමග ගිවිසුම් අත්සන් කරනු ලැබේ. | ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ණය ගිවිසුම අනුව, සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමට 2020 වර්ෂය සඳහා වාර්ෂික අයවැය සහ වැඩ සැලැස්ම සම්පූර්ණ කර නොතිබුණි. | වැඩ සැලැස්ම සහ අයවැය සමාලෝචන කමිටුවට ඉදිරිපත් කර තිබුණි. | අයවැය සහ වැඩ සැලැස්ම පිළියෙල කර සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2020 පෙබරවාරි 17 දිනැති අංක ඩීඑම්එස්/0049 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව, අර්ධ කාලීන සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට නිවාඩු දින වැටුප් සහ අතිකාල ගෙවීම නතර කර තිබුණි. කෙසේවෙතත්, උතුරු මැද පළාතේ කාර්ය මණ්ඩලයට එකතුව රු. 480,995ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍යතා සමග අනුගත වීම අවශ්‍ය වේ. |